අප භාවිතා කරනා භාෂාව තුල ඇතැම් විට අතීතයේ සිටම ව්‍යවහාර කෙරුණු, එහෙත් වර්තමානයේදී පසුගාමී අදහසක් ජනිත කෙරෙන්නේදැයි විමසිය යුතු යෙදුම් පවතී. එවැනි යෙදුමක් වර්තමානයට කෙතරම් ගැලපෙන්නේද යන්න කතිකාවට ලක් විය යුතු වේ. ඊට එක් උදාහරණයක් ලෙස "හාම්පුතා" වැනි යෙදුම් දැක්විය හැක.

හාම්පුතා යන යෙදුම මගින් අතීතයේ නියෝජනය වූ සමාජ සම්බන්ධතාවය වර්තමානය වන විට වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයක් දක්වා වෙනස් වී තිබෙනා බව දැකිය හැක. වර්තමානයේදී දක්නට ලැබෙනා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවය හා සසඳා බලන විට, හාම්පුතා යන යෙදුම ඔස්සේ වඩාත් පසුගාමී ස්වාමි-සේවක සම්බන්ධතාවයක් ඉදිරිපත් වෙයි. හාම්පුතා වැනි යෙදුම් වර්තමානයට නොගැලපෙන බවට එක් නිදසුනක් නම්, අතීතයේ 'ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය' ලෙසින් වූ නාමය පවා වර්තමානයේදී 'ලංකා සේව්‍ය සම්මේලනය' බවට වෙනස්ව තිබීමයි. එසේ නම්, පහත දැක්වෙනාකාරයේ පුවත් ඉදිරිපත් කිරීමේදී, මාධ්‍ය මගින් 'හාම්පුතා' වැනි යෙදුම් වෙනුවට වඩාත් වර්තමානයට ගැලපෙන පරිදි සේවායෝජක, සේව්‍ය වැනි යෙදුම් යොදාගැනීම උචිත නොවන්නේද? එසේත් නැතිනම් ඒ සඳහා ගැලපෙන වෙනත් යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna #Aruna